# ACCOUNTING FOR RESERVE CAPITALIZATION

# &

# RIGHT ISSUE

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

## හිමිකම් නිකුතුව

හිමිකම් නිකුතුව යනු, සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අය කර ගෙන කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීමයි.

## සංචිත ප්‍රාග්ධනිත කිරීම

සංචිත ප්‍රාග්ධනිත කිරීම යනු, සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ගෙන් මුදල් ලබා නොගෙන සංචිත භාවිත කර කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීමයි.

ClassWork.LK

## හිමිකම් නිකුතුවට අදාළ ජර්නල් සටහන

මුදල් ගිණුම හර

සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම බැර

( --------- අනුපාතයට හිමිකම් කොටස් නිකුත් කිරීම )

## සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජර්නල් සටහන

අදාළ සංචිත ගිණුම් හර

සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම බැර

(---------- අනුපාතයට හිමිකම් කොටස් නිකුත් කිරීම )

ClassWork.LK

## අභ්‍යාසය - 01

1. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනීත කිරීම අතර අසමානතා දක්වන්න.

| නිර්ණායකය | හිමිකම් නිකුතුව | සංචිත ප්‍රාග්ධනීත කිරීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහය | | |
| මුළු හිමිකම | | |
| සංචිත භාවිත කිරීම | | |
| කොටස්කරුවන්ගේ ප්‍රමාණය | | |

2. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනීත කිරීම අතර සමාන ලක්ෂණ

| | |
|---|---|
| 1. | |
| 2. | |

ClassWork.LK

## අභ්‍යාසය - 02

සීමාසහිත ඇතුගල්පුර පොදු සමාගමේ 2018.01.01 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (උද්ධෘතය)

රු. 000

| | | | |
|---|---|---|---|
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | (100 000) | | 4 000 |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1 000 | |
| පොදු සංචිතය | | 500 | |
| රඳවාගත් ඉපැයුම් | | 2000 | 3 500 |

2018.01.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තීරණ ගන්නා ලදී.

1) සමාගමේ දැනට තිබෙන සෑම සාමාන්‍ය කොටස් 4:1 බැගින් රු.40ක ප්‍රතිෂ්ඨාවකට රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කිරීම.

ClassWork.LK

2) සංචිත ප්‍රාග්ධනිත කිරීමට පෙර පැවති සෑම සාමාන්‍ය කොටස් 5:1 බැගින් රු. 50ක ප්‍රතිෂ්ඨාවක් මත හිමිකම් කොටස් නිකුතුවක් කිරීම.

**අවශ්‍ය වන්නේ :**

i) ඉහත ගනුදෙනු හා සිද්ධිවලට අදාළ ජර්නල් සටහන් දැක්වීම.

ii) ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමට අවශ්‍ය ලෙජර් ගිණුම පිළියෙල කිරීම.

iii) ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන් දැක්වීම.

**උපදෙස් :**

දැනට තිබෙන කොටසක ප්‍රතිෂ්ඨාව $= \frac{4\ 000\ 000}{100\ 000}$

= රු. 40

ClassWork.LK

සංචිත ප්‍රාග්ධනීත කරන කොටස්වල වටිනාකම $= \frac{100\ 000}{5} \times 50$

$=$ රු. 1 000 000

හිමිකම් නිකුතුවට අදාළ කොටස්වල වටිනාකම $= \frac{100\ 000}{5} \times 50$

$=$ රු. 1 000 000

ClassWork.LK

## අභ්‍යාසය - 03

**සීමාසහිත සෙනුප් පොදු සමාගමේ 2018.01.01 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (උද්ධෘතය)**

| | රු.000 |
|---|---|
| **ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනය** | |
| රු.50/- සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 5000 |
| **සංචිත** | |
| රඳවා ගත් ඉපැයුම් | 3000 |

පහත දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට පෙර මූල්‍ය කාණ්ඩයන් ඉහත දැක්වේ.

1) සෑම සාමාන්‍ය කොටස් 4 : 1 බැගින් රු. 50 ක ප්‍රතිෂ්ඨාවක් මත හිමිකම් නිකුතුවක් සිදු කිරීම

2) හිමිකම් නිකුතුවට පසුව එම කොටස්වලට ද අදාළ වන පරිදි රු. 50 ක ප්‍රතිෂ්ඨාවක් මත 5 : 1ක සංචිත ප්‍රාග්ධනිත කිරීම

ClassWork.LK

**අවශ්‍යවන්නේ :**

i) ඉහත ගනුදෙනු වාර්තා කර ඇති අයුරු දැක්වෙන ජර්නල් සටහන් පිළියෙල කරගැනීම.

ii) ඉහත ගනුදෙනු වාර්තා කර ඇති අයුරු දැක්වෙන ලෙජර් ගිණුම් පිළියෙල කරගැනීම.

ClassWork.LK

## අභ්‍යාසය - 04

1. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීමේ අසමානකම් දක්වන්න.

2. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීමේ සමානකම් දක්වන්න.

3. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජර්නල් සටහන් උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

4. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ලෙජර් ගිනුම් පිළියෙල කරන්න.

5. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීමෙන් පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550


S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura